MONEY

&

FINANCIAL INSTITUTIONS

(Part-V)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

තැන්පතු භාර ගැනීම හා ණය සැපයීම ට අමතර ව වාණිජ බැංකු විසින් සපයනු ලබන අනෙකුත් සේවා

තැන්පතු භාර ගැනීම හා ණය සැපයීම ට අමතර ව වාණිජ බැංකු විසින් ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට බලපාන පහත සඳහන් සේවා ද සපයනු ලබයි.

නියෝජිත සේවා

වාණිජ බැංකු විසින් ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවල දී ගනුදෙනුකරුවන් වෙනුවෙන් නියෝජිතයෙකු ලෙස කටයුතු කරයි.

නිදසුන් :

- සුරැකුම්පත් මිලයට ගැනීම හා විකිණීම
- ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම
- විදුලි බිල්පත් හා ජල බිල්පත් ගෙවීම

කල්බදු සේවා

ClassWork.LK

විද්‍යුත් බැංකු සේවා (E- Banking)

අන්තර්ජාලය හරහා බැංකු කටයුතු සිදු කර ගැනීම සඳහා ගනුදෙනුකරුවන්ට සපයා ඇති පහසුකම විද්‍යුත් බැංකු සේවා ලෙස හඳුන්වයි. එවැනි පහසුකම් කිහිපයක් පහත දැක්වේ.

හෝම් බෑංකින් (Home Banking)

තම පෞද්ගලික පරිගණකය මගින් අන්තර්ජාලය හරහා බැංකුවේ වෙබ් අඩවියට පිවිස රහස් අංකය භාවිත කොට ස්වයංක්‍රීය ව බැංකු පහසුකම් ලබා ගැනීම මෙහි අදහසයි.

දුරකථන බැංකු සේවා (Tele Banking)

ගනුදෙනුකරු බැංකුව වෙත නො ගොස් ත

උකස් සේවා

ස්වර්ණාභරණ ඇපයට ගෙන හදිසි මුදල් අවශ්‍යතා සඳහා ණය ලබා දීම වාණිජ බැංකු විසින් සිදු කරන වැදගත් සේවාවකි.

ClassWork LK

සුරක්ෂිතාගාර පහසුකම්

පුද්ගලයින්ගේ රන්, රිදී, මුතු, මැණික් ආභරණ, ඔප්පු වැනි වටිනා භාණ්ඩ හා වැදගත් ලියවිලි ආරක්ෂා කර දීම වාණිජ බැංකු විසින් සිදු කරයි. මේ සඳහා වාණිජ බැංකුවල විශේෂිත සේප්පු වෙන් කර ඇත.

විදේශ විනිමය මිල දී ගැනීම හා විකිණීම

විනිමය පාලන නියමයන් යටතේ ගනුදෙනුකරුවන්ගේ විදේශ මුදල් මිලට ගැනීමත්, ඔවුන්ට අවශ්‍ය විදේශ මුදල් විකිණීමත් වාණිජ බැංකු විසින් සිදු කරයි.

ClassWork.LK

ණයපත් සේවාව

කිසියම් නිශ්චිත වටිනාකමක් දක්වා අනුමත ආයතනවලින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට හැකි වන පරිදි වාණිජ බැංකු හෝ බලයලත් ආයතන විසින් නිකුත් කරන කාඩ්පත් විශේෂයකි. ණයපත් මගින් යම් සීමාවක් දක්වා ස්වයංක්‍රීය
ටෙලර් යන්ත්‍ර භාවිතයෙන් මුදල් ලබා ගැනීමේ හැකියාව ද ඇත.

නිදසුන් :

- වීසා කාඩ්
- මාස්ටර් කාඩ්
- ඇමරිකන් එක්ස්ප්‍රස් කාඩ්

මුදල් ප්‍රේෂණ කටයුතු

ගිණුම් හිමියා වෙනුවෙන් ඔහුට ලැබීමට ඇති මුදල් ඔහුගේ ගිණුමට රැස් කිරීම මින් අදහස් වේ. විදේශයක සිටින පුද්ගලයින්ගෙන් ලැබෙන මුදල් රැස් කිරීම ද මේ යටතේ සිදු කෙරේ.

ClassWork.LK

සංචාරක චෙක්පත් නිකුත් කිරීම

දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ගනුදෙනු පහසුවෙන් හා ආරක්ෂාකාරී ව සිදු කිරීම සඳහා භාවිත කෙරෙන චෙක්පත් විශේෂයකි.

සංචාරක චෙක්පත්, පොදුවේ පිළිගන්නා මුදල් වර්ගවලින්, විවිධ වටිනාකම් යටතේ නිකුත් කරයි. තමන් සතු මුදල් බැංකුවට ලබා දී එම වටිනාකමට බැංකුවෙන් සංචාරක චෙක්පත් ලබා ගන්නා අතර, සංචාරයේ යෙදෙන අතරතුර දී එම ප්‍රදේශයේ වාණිජ බැංකුවකට එම සංරචක චෙක්පත් ලබා දී නැවත මුදල් ලබා ගැනීමට හැකියාව ඇත.

නිකුත් කිරීමේ දී බැංකුව විසින් සේවා ගාස්තුවක් අය කරනු ලබයි.

Class Work.LK

ස්වයංක්‍රීය බැංකු සේවා

බැංකු ගිණුම් හිමියන්ට තම බැංකුවෙන් ලබා දී ඇති පහසුකම් බොහොමයක් බැංකුවට නො ගොස් දවසේ ඕනෑ ම වේලාවක ලබා ගැනීමට හැකි වන සේ හඳුන්වා දී ඇති විද්‍යුත් අරමුදල් හුවමාරු ක්‍රමයකි. මෙමගින් ගනුදෙනුකරුවන්ට බැංකුවලින් පහත සේවා ලබා ගත හැකි ය.

ස්වයංක්‍රීය බැංකු සේවා නිසා ගනුදෙනුකරුවන්ට අත්වන වාසි

- ටෙලර් කාඩ්පත් භාවිතයෙන් ගිණුමෙන් මුදල් ආපසු ගැනීම
- ගිණුමට මුදල් තැන්පත් කිරීම
- ගිණුමකින් ගිණුමකට මුදල් මාරු කිරීම
- ගිණුමේ ශේෂය දැන ගත හැකි වීම
- බිල්පත් ගෙවීමේ පහසුකම් තිබීම

ClassWork.LK

ස්වයංක්‍රීය බැංකු සේවා නිසා බැංකුවලට අත්වන වාසි

- පිරිවැය අඩු වීම
- තදබදය අඩු වීම
- නිරවද්‍යතාව ඉහළ වීම
- කාර්ය මණ්ඩලය අඩු කර ගත හැකි වීම
- බැංකු සේවා පුළුල් වී බැංකුවල ලාභදායිත්වය වැඩි වීම

ණයවර ලිපි නිකුත් කිරීම

ආනයනකරුගේ ඉල්ලීම මත ආනයනකරුගේ බැංකුව විසින් ආනයනකරු වෙනුවෙන් මුදල් ගෙවන බවට එකග වෙමින් අපනයනකරුගේ බැංකුව වෙත ඉදිරිපත් කරන ලියවිල්ල ණයවර ලිපියයි.

ClassWork.LK

වෙනත් සේවා

- රක්ෂණ සේවා - වාණිජ බැංකු විසින් රක්ෂණ සමාගමක් සමග සම්බන්ධ වී තම බැංකුවේ ගිණුම් හිමියන් රක්ෂණය කිරීම
- වෛද්‍ය සේවා සැපයීම (E- channalling - E- Billing)
- ජනාකීර්ණ ස්ථානවල ATM යන්ත්‍ර ස්ථාපිත කර තිබීම
- චෙක්පත් හා මුදල් තැන්පත් කිරීම සඳහා ම සුවිශේෂී වු ATM යන්ත්‍ර ස්ථාපිත කර තිබීම

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura